# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 14 දරන
# සමාජශාලාවලට බලපත්‍ර දීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 මාර්තු මස 4 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 මාර්තු මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 35 යි　　　　තැපැල් ගාස්තුව ශත 25 යි

# 1980 අංක 14 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 මාර්තු මස 4 වන දින]

එල්. ඩී.—ඕ. 67/79.

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1980 අංක 14 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 17 දරන පනතෙහි 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනතෙහි 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) (1) වන උපවගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද, නිශ්චිතව දක්වන ලද දිනයෙහි හෝ ඒ දිනයට පසුව ආරම්භ කරන ලද කිසිම සමාජශාලාවක්, යම් පළාත් පාලන ආයතනයක සභාපතිවරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරය යටතේ මිස, ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන සීමා තුළ පවත්වා ගෙන යාම නොකළ යුතු ය.

මේ උපවගන්තියෙහි "නිශ්චිතව දක්වන ලද දිනය" යන්නෙන්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් මේ උපවගන්තියෙහි කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන දිනයක් අදහස් වේ."; තවද

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "(1) වන උප වගන්තිය කඩ කරමින්" යන වචන වෙනුවට "(1) වන උපවගන්තියේ හෝ (1අ) වන උපවගන්තියේ හෝ විධි විධාන කඩ කරමින්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙහි අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"එසේ වුව ද, එසේ නියම කරනු ලබන ගාස්තු, පහත සඳහන් සීමා නොඉක්ම විය යුතු ය :—

| | රු. |
|---|---|
| (අ) කොළඹ මහා නගර සභාව සම්බන්ධයෙන් වූ විට ... ... | 5,000 |

2—ඒ 47633—10,500 (80/01)

රු.

(ආ) වෙනත් යම් මහා නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට ... ... 5,000

(ඇ) යම් නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට ... 1,500

(ඈ) යම් සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් සම්බන්ධයෙන් වූ විට ... ... 350. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියෙහි " සති දෙකක් " යන වචන වෙනුවට " සති හතරක් " යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" වැරදි සහ දණ්ඩන.

24. (1) මේ පනත යටතේ හෝ, ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වරදක් කරන සෑම තැනැත්තකු ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරද කරු කරනු ලැබූ විට, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි හෝ වෙනත් යම් නීතියක හෝ කුමක් සඳහන් ව ඇත ද, මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන් දහසක් නොඉක්ම වන දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ නියම කරනු ලැබූ දඩයක් අයකර ගනු ලබන අවස්ථාවක, පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු ලෙස මේ පනතේ 4 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබ ඇති ගාස්තුවට සමාන වන ඒ දඩය හෝ දඩයේ ඒ කොටස, වරද සිදු කරන ලද්දේ යම් සමාජශාලාවක් සම්බන්ධයෙන් ද, ඒ සමාජශාලාව පිහිටා තිබෙන පරිපාලන සීමාව අයත් පළාත් පාලන ආයතනයේ අරමුදලට ගෙවන ලෙස අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය.".